# ලංසු ආරාධනාවයි!

## දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - පුත්තලම

පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් පහත සේවාවන් සඳහා විවෘත ලංසු කැඳවනු ලැබේ.

| අනු අංකය | ලංසු අංකය | සේවාව | ආපසු නොගෙවන ලංසු තැන්පත් මුදල (රු.) | ආරක්ෂණ තැන්පතු මුදල (රු.) |
|---|---|---|---|---|
| 01. | PU/PR/SER/24/105 | 2025 වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 හි ඇති වාහන 45 ක් රක්ෂණය කිරීම. | රු.1,000.00 | - |
| 02. | PU/PR/SER/24/107 | 2025 වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 හි පිරිසිදු කිරීමේ සේවාව පවත්වාගෙන යාම. | රු.1,000.00 | තෝරාගත් ලංසුකරු දිස්ත්‍රික් ලේකම් නමින් රු.50,000.00 ක මුදලක් ආරක්ෂණ තැන්පතුවක් ලෙස තැබිය යුතුය. |

02. ලංසු පත්‍රිකා 2024.12.04 වන බදාදා සිට 2024.12.23 වන සඳුදා දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ඉහත සඳහන් පරිදි ගාස්තු පුත්තලම ලංකා බැංකුව වෙත ගෙවීමෙන් පසු ලංසු ලියවිලි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන ඒකකයෙන් ලබා ගත හැක.

03. ලංසුව "මුල් පිටපත" හා "අනු පිටපත" ලෙස කට්ටල දෙකකින් යුතුව සම්පූර්ණ කර, මුද්‍රා තබන ලද කවරවල වෙන වෙනම දමා එක් මුද්‍රා තැබූ කවරයකට බහා ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාල ලංසු අංකය සහ අදාල සේවාව සඳහන් කර 2024.12.24 වන අඟහරුවාදා ප.ව. 2.00 ට පෙර ලැබෙනසේ දිස්ත්‍රික් ලේකම් / සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවන ලෙසට හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන ඒකකයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලන ලෙසට දන්වමි. ප.ව 2.00 වේලාව ඉක්ම වූ වහාම ලංසු විවෘත කිරීම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ප්‍රසම්පාදන ඒකකයේ දී සිදු කරනු ලැබේ.

04. සේවා සැපයුම්කරු තෝරා ගැනීමේදී ආයතනයේ ලියාපදිංචිය, පළපුරුද්ද සහ ඔබ විසින් ලබා දෙන්නා වූ විශේෂ සේවාවන් යන සියළුම කරුණු පිළිබඳව ඇගැයීම් කිරීමේදී සැලකිලිමත් වන බැවින් ඔබගේ පළපුරුද්ද සනාථ කිරීම සඳහා අවශ්‍ය සියළු ලියවිලි වල සහතික පිටපත් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

05. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයකුට සහභාගී වීමට අවසර ඇත.

06. අනු අංක 02 සඳහා ආරක්ෂණ තැන්පතුව මුදලින් තැබීම අනිවාර්ය වේ.

07. වැඩි විස්තර දුරකථන අංක 032 - 2265234 මඟින් ලබා ගත හැකිය.

2024.12.04

එච්.එම්.එස්.පී.හේරත්,
සභාපති / දිස්ත්‍රික් ලේකම්,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
පුත්තලම පරිපාලන දිස්ත්‍රික්කය.